# කැකිරාව ප්‍රාදේශිය සභාව

# අයවැය ඇස්තමේන්තුව

# 2025

| | | |
|---|---|---|
| • ලිපිනය | - ජයන්ති මාවත,කැකිරාව | |
| • දුරකතන අංක | -කැකිරාව ප්‍රධාන කාර්යාලය | 025 2264275 |
| | -මරදන්කඩවල උප කාර්යාලය | 025 2053727 |
| | -පලුගස්වැව උප කාර්යාලය | 025 3242852 |
| | -මඩාටුගම උප කර්යාලය | 025 3890883 |
| • ෆැක්ස් අංකය | -කැකිරාව ප්‍රධාන කාර්යාලය | 025 2264275 |
| • විද්‍යුත් තැපැල | -kekirawasabha@gmail.com | |
| • වෙබ් ලිපිනය | -kekirawa.ps.gov.lk | |
| • Face Book | -kekirawa pradeshiya sabha | |
| • Whatsapp | -077 8807467 | |

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ vi වන කොටසේ 168(1) හා 168(2) වගන්ති ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර සම්මත කර ගැනීම සඳහා සභාපතිවරයා වෙත පැවරී ඇති බලතල ධූර කාලය අවසන් වූ පළාත් පාලන ආයතන සඳහා සභාව වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් ඉටුකිරීමේදී 1987 අංක 15 දරණ ප්‍රා දේශීය සභා පනතේ 9(3) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමන් විසින් බලාත්මක කරන ලද 2182/39-2020.07.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය හා "ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති" වලට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් හඳුන්වාදුන් පළාත් පාලන ආයතන සඳහා වූ "ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017" ට අනුකූලව 2025 වර්ෂය වෙනුවෙන් මෙම අයවැය ලේඛනය සකස් කර ප්‍රකාශයට පත්කරන ලදි.

ඒ.එම්.ඒ.එස්.කේ.රත්නායක,

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරි,

කැකිරාව ප්‍රාදේශීය සභාව

2024.12.

## තීරණ අංකය - KPS/2024/12/24/517

2025 අයවැය ඇස්තමේන්තුව සභා සම්මත වීම

2025 වර්ෂය සඳහා කැකිරාව ප්‍රාදේශීය සභාව වෙනුවෙන් සකස් කරන ලද අයවැය ඇස්තමේන්තුව 2024.12.24 වන දින පැවැති කැකිරාව ප්‍රාදේශීය සභා පරිපාලන කමිටු රැස්වීමේදි පරිපාලන කමිටු සාමාජික සාමාජිකාවන් සියලු දෙනාගේ එකඟත්වයෙන් සම්මත කරන ලදි

## අපගේ දැක්ම

"තිරසර සංවර්ධනය තුලින් සවිබල ගැන්වූ තෘප්තිමත් ජනතාවක්"

## අපගේ මෙහෙවර

"කැකිරාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ
පොදු පහසුකම් ඵලදායී ලෙස අප්‍රමාදව ජනතාවට ලබාදීම උදෙසා
සභාව සතු සියලුම සම්පත් නිසි කළමනාකරණයකින් ද
මධ්‍යම ආණ්ඩුව, පළාත් සභාව හා රාජ්‍ය නොවන සංවිධානයන්ගේ
උපරිම දායකත්ය ලබා ගනිමින්ද
සංස්කෘතික හා ආගමික සාරධර්මයන් ඔප්නංවමින්
කාර්යක්ෂමව රාජ්‍ය සේවයක් තුලින්
තිරසාර කඩිනම් සංවර්ධන වැඩපිළිවෙලක් දියත් කරමින්
ජනතා සේවාවන් සැපයීම"

## අපගේ අරමුණ

අවංකව
ප්‍රඥාපන්නව
ආචාර සම්පන්නව
අවබෝධයෙන් යුක්තව
විෂය මූලිකව
අපක්ෂපාතීව
විනිවිදභාවයෙන් යුක්තව
විගවීමෙන්
අප්‍රමාදව
කාර්යක්ෂමව
හා
සඵලතාවයෙන්
ලබාදීමට කැපවී සිටින්නෙමු

## ලේකම්තුමියගේ පණිවිඩය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් ස්ථාපිත, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වර්ග කි.මී.540ක වපසරියක් පුරා විසිරී පැතිරී ඇති කැකිරාව හා පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් ආවරණය වන පරිදි, තුලාන් 69ක් හා ගම්මාන 164කින් සමන්විත 89, 743 ක් ඉක්ම වූ ජනතාවක් සඳහා සේවයට ඇප කැප වූ පළාත් පාලන ආයතනයක් ලෙස කැකිරාව ප්‍රාදේශීය සභාව විසින් සියලු පාර්ශ්වයන් සහ සම්බන්ධ කරගනිමින් 2025 වර්ෂය වෙනුවෙන් සම්පාදනය කරන ලද අයවැය වාර්තාව සත්වන සැසිවාරය අවසන්ව විසුරුවා හැර ඇති අවස්ථාවක වුවත් කැකිරාව ප්‍රාදේශීය සභාවේ ගණන් දීමේ නිලධාරී ලෙසත්, ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී ලෙසත් මෙසේ ඉදිරිපත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි.

වර්ෂ පහක් පුරා පැවති එනම් 2019-2023 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක වූ කැකිරාව ප්‍රාදේශීය සභාවේ සත්වන සැසි වාරය 2023.03.19 වන දින අවසන් වූ අතර, ඉන් ඉක්බිති 1987 අං 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්ති ප්‍රකාරව මා වෙත පැවරුණ බලතල ප්‍රකාරව දේශපාලන නායකත්වයක් නොමැති මොහොතක වුවත් ඉදිරි 2025 වර්ෂය තුළ ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට අපේක්ෂිත සේවා සමූහයත්, ඒ වෙනුවෙන් අරමුදල් සම්පාදනය කර ගන්නා ආකාරයත් මෙම අයවැය ලේඛනය තුළින් නිරූපනය කරයි. මෙම අයවැය ලේඛනය සැකසීමේ දී යෙදවුම් ලෙස අප ආයතනය කෙරෙහි ඇල්මැති පාර්ශ්ව වල අදහස් හා යෝජනා ලබා ගැනීමට කටයුතු කර ඇති බව සතුටින් යුතුව ප්‍රකාශ කරමි.

2024 වර්ෂය දෙස ආපසු හැරී බැලීමේ දී ප්‍රධාන වශයෙන් ලද ජයග්‍රහණ කිහිපයක් සිහිපත් කරන්නේ නම්

- ✓ කැකිරාව මහජන පුස්තකාලය හා මඩාටුගම මහජන පුස්තකාලය නවීකරණය කිරිමට හැකිවීම
- ✓ මහවැව ජල ව්‍යාපෘතිය ආරක්ෂිත වැට ඉදිකිරම හා නවීකරණය කිරීමට හැකි වීම.
- ✓ කුඹුක සිසිල භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම හා ළමා ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා කිරීමට හැකි වීම.
- ✓ ඉදිකිරීම් කටයුතු අඩක් අවසන් කළ හබරණ සතිපොල නවීකරණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ජනතාව වෙනුවෙන් විවෘත කිරීමට ලැබීම.
- ✓ 2004 වර්ෂයේ දී තක්සේරු කල වරිපනම් දේපල (වසර 19කට පසු) වටිනාකම 2023 වර්ෂයේ දී ප්‍රතිශෝධනය කිරීමට හැකි වීම හා 2024 වර්ෂය තුල වරිපනම් පැනවීමට හැකිවීම ආදායම් රැස්කිරිම.
- ✓ හබරණ සංචාරක පුරවරයේ විශාල අඩුපාඩුවක්ව පැවති පොදු වැසිකිළියේ (හබරණ සතිපොල අසළ) ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට හැකි වීම හා ජනතා පරිහරණයට ලබා දිම.
- ✓ ඉදිකිරීම් කටයුතු සාර්ථකව අවසන් කරන ලද දිවා සුරැකුම් මධ්‍යස්ථානය හා පෙර පාසල මහජන අයිතියට පත්කිරිම.
- ✓ ජාතික කියවීමේ මාසය 2024 සමගාමීව සම්මාන ප්‍රදාන උත්සවයේදී කැකිරාව ප්‍රාදේශිය සභාව දෙවන ස්ථානයට පත්වීම හා ස්වර්ණපුරවර 2023 තරගාවලියේදී ප්‍රාදේශිය සභා අතරින් තෙවන ස්ථානයද පළාත් මට්ටමින් සිව්වන ස්ථානයද ළගා කර ගැනිමට හැකි වීම ද අප විසින් ලබා ගත් ජයග්‍රහණ වේ

2024 වසර මෙන්ම 2025 වසර ද ඉතාමත් අභියෝගාත්මක වර්ෂයක් වනු නොඅනුමාන ය. මධ්‍යම රජයේ බදු ප්‍රතිපත්ති සමඟ දිවයින තුළ භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් ඇති වන උද්ධමනකාරී තත්ත්වය පුද්ගලික අංශයට බලපෑම් ඇති කරනුයේ යම් සේද එලෙසින්ම අඩු නැතිව රාජ්‍ය ආයතන වුව අප ආයතනවලට ද එළෙසින්ම බලපෑම් කරනු ඇත. කෙසේ වෙතත් සියලු අභියෝගයන් මැද වුව ජනතාව වෙනුවෙන් කළ හැකි උපරිම සේවය කාර්යක්ෂමව හා සඵලදායීව සැපයීම අපගේ එකම අරමුණයි. ඒ සඳහා අනවශ්‍ය වියදම් හැකිතාක් අවම වන සේ වියදම් පාලනය කිරීම, ශ්‍රම සම්පතෙන් උපරිම ප්‍රයෝජන ලැබෙන ආකාරයට කාර්යක්ෂමතාවයෙන් යුතුව යෙදවීම හා ඒ සඳහා නිසි අධීක්ෂණයක් පොදුවේ අංශ මට්ටමින් මෙන්ම පුද්ගලයන් වශයෙන් එක් එක් නිලධාරියා/සේවකයා සඳහා කාර්ය සාධන ඇගයුම් දර්ශක සකස් කිරීමටත් අවශ්‍ය විධිවිධාන යොදා ඇත. එමෙන්ම නිෂ්කාර්යව පවතින වත්කම් ඵලදායී කාර්යයන්වල යෙදවීම මෙන්ම, පවතින ආදායම් මාර්ග සංවර්ධනය කිරීම හා නව ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමුකර සහා අරමුදල් ශක්තිමත් කර ගැනීම කෙරෙහි මාගේ විශේෂ අවධානය යොමු කර ඇත.

2025 වර්ෂයේ දී ද පොදු මහජනතාවගේ අවශ්‍යතා නිසි පරිදි සපුරාලනු වස් මෙම අයවැය ලේඛනය යටතේ ස්වයං උත්පාදිත ආදායම්, පළාත් සභාවෙන් ලැබෙන ප්‍ර ප්‍රතිපාදන, මධ්‍යම රජය නියෝජනය කරමින් අමාත්‍යාංශ හරහා ලැබෙන ප්‍රතිපාදන පමණක් නොව විදෙස් අරමුදල් සැපයෙන ව්‍යාපෘති සහාය ලබා ගනිමින් පහත සඳහන් සංවර්ධනයන් සිදුකිරීමට මා බලාපොරොත්තු වෙමි.

**පළමුව අපි සභාවේ ස්වයං උත්පාදිත ආදායමින් 2025 වර්ෂයේ දී ඉටු කිරීමට අපේක්ෂිත ඉලක්ක මොනවාද යන්න සළකා බලමු.**

- සංවර්ධන හා පරිපාලන කටයුතු කැකිරාව නගරයට පමණක් සීමා නොවී අනෙකුත් උප නගරයන්ගේ ද විධිමත්ව හා කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමේ අරමුණින් මරදන්කඩවල, මඩාටුගම හා පලුගස්වැව යනාදි උප කාර්යාලයන් අළුත්වැඩියා කිරීම හා ආරක්ෂිත වැටවල් යොදා එම දේපළ ආරක්ෂා කිරීම.
- පොදු ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවයන් තෘප්ත කරලනු වස් කැකිරාව ආදාහනාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම, නගර ශාලාව අළුත්වැඩියා කිරීම, කුලී පදනමට ලබා දෙන කඩ කාමර අළුත්වැඩියා කිරීම හා එම දේපළ ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂිත වැටවල් යෙදීම.
- බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 9.2 ක් වෙන් කිරීම.
- ආදාහනාගාරය අලුත්වැඩියා කටයුතු සඳහා  රු.මි.1.5 වෙන් කිරිම
- බල ප්‍රදේශයේ පාරිභෝගික ජනතාවට සෞඛ්‍යාරක්ෂිතව පහසු මිල ගණන් යටතේ මස් හා මාළු මිල දී ගැනීම සඳහා සුදුසු අළෙවි කුටි ඉදිකිරීම. (රු.මි.0.6)

2025 වර්ෂයේ ඉදිරි සංවර්ධන ඉලක්ක ඉටු කිරීම සඳහා ගත හැකි සියලු ප්‍රයත්නයන් ගැනීම මාගේ පරම යුතුකම සේ සළකා කටයුතු කරන බවත්, ඒ සඳහා ඔබ සැම සියලු දෙනාගේම සහාය හා ආශිර්වාදය ලබාදනු ඇතැයි මා තරයේ විශ්වාස කරමි.

2025 වර්ෂය සඳහා වන මෙම අයවැය ලේඛනය සකස් කිරීමේ දී මා හට සහයෝගය ලබාදුන් ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී මහතා, ගිණුම් විෂය භාරව කටයුතු කරන සහකාර ගිණුම් නිලධාරීතුමිය ඇතුළු කොටගත් සමස්ප කාර්ය මණ්ඩලයට මාගේ හදපිරි ස්තූතිය හා ප්‍රණාමය මේ සමඟ පිරිනමන අතර, 2025 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ඉලක්ක හා අනෙකුත් සියලු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් කැකිරාව ප්‍රාදේශීය සභාව උතුරුමැද පළාතේ ප්‍රශස්ථතම පළාත් පාලන ආයතනයක් බවට පත්කරලීම වෙනුවෙන් ඔබගේ නොමසුරු දායකත්වය මා බලාපොරොත්තු වන අතර, නොබෝ දිනකින් ලබන්නා වූ 2025 වර්ෂය ඔබ සැම සියලු දෙනාටම නිදුක් නිරෝගී වාසනාවන්ත සුභ නව වසරක් වේවායි මා ප්‍රාර්ථනා කරමි.

එ.එම්.ඒ.එස්.කේ. රත්නායක,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරී,
කැකිරාව ප්‍රාදේශීය සභාව.
2024.

## කැකිරාව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී තුලාන්, ඊට අයත් ගම්මාන හා ජනගහනය

### කැකිරාව කොට්ඨාශය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | | ගම්මානය | පවුල් ගණන | ජනගහනය | | | පුම්තිරි අනුපාතය |
|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | |
| 605 | නාවක්කුලම | නාවක්කුලම | 278 | 431 | 413 | 844 | 1:1:04 |
| | | අමුණුකොලේ | 89 | 128 | 123 | 251 | 1:1:04 |
| 606 | මොරගොඩ | මොරගොඩ | 156 | 181 | 220 | 401 | 43.24 |
| | | උණගොල්ලෑව | 81 | 120 | 121 | 241 | 25.83 |
| | | බැදිවැව | 110 | 137 | 146 | 283 | 30.48 |
| 607 | කීරියගස්වැව | කළුඑබේ | 114 | 155 | 168 | 323 | 68.7 |
| | | කීරියගස්වැව | 49 | 72 | 75 | 147 | 31.2 |
| 608 | මහදිවුල්වැව | මහදිවුල්වැව | 224 | 308 | 323 | 631 | 09 |
| | | කෝන්වැව | 12 | 12 | 13 | 25 | 1:08 |
| 609 | හීණුක්කිරියාව | හීණුක්කිරියාව | 310 | 481 | 455 | 936 | 1:1.057 |
| | | උල්පත | 105 | 208 | 182 | 390 | 1:1.14 |
| 610 | ගනේවල්පොල | ගනේවල්පොල | 516 | 1018 | 991 | 2009 | 1:1:02 |
| 611 | මාමිණියා රඹෑව | මාමිණියාව රඹෑව | 258 | 370 | 365 | 735 | 1:1:01 |
| | | නිකවැව | 159 | 275 | 297 | 572 | 1:0.02 |
| | | කදුබොඩ | 32 | 58 | 63 | 121 | 1:0:92 |
| | | හිත්තරගම | 24 | 30 | 30 | 60 | 1:1:00 |
| 612 | කොල්ලන්කුට්ටිගම | ඇටවීරවැව | 184 | 355 | 344 | 699 | 1:1:03 |
| | | කොල්ලන්කුට්ටිගම | 260 | 825 | 839 | 1664 | 1:0:98 |
| 613 | මාමිණියාව | මාමිණියාව | 292 | 365 | 360 | 725 | 1:1.013 |
| 614 | තෝරුවැව | තෝරුවැව | 119 | 183 | 170 | 353 | 1:1.38 |
| | | නොච්චිකුලම | 77 | 131 | 112 | 243 | 1:1.06 |
| | | කහටගස්වැව | 29 | 74 | 64 | 138 | 1:076 |
| 615 | කැලෑ පුලියන්කුලම | කැලෑපුලියන්කුලම | 74 | 98 | 110 | 208 | 1:145 |
| | | කදුබොඩගම | 62 | 86 | 80 | 166 | 1:078 |
| | | කදිරාගම | 74 | 137 | 99 | 236 | 1:098 |
| | | නාවක්කුලම | 106 | 166 | 156 | 322 | 1:0.93 |
| 616 | ඉහළ පුලියන්කුලම | ඉහලපුලියන්කුලම | 285 | 515 | 500 | 1015 | 1:0.72 |
| | | උලංකුලම | 158 | 202 | 175 | 377 | 1:6.96 |
| | | ඇතිනිවැටුණුවැව | 80 | 144 | 157 | 301 | 1:1.03 |
| 617 | මරදන්කඩවල | මරදන්කඩවල | 71 | 112 | 116 | 228 | 1:1.13 |
| | | මරදන්කඩවල නැගෙනහිර | 410 | 705 | 684 | 1389 | 1:1.9 |
| | | මරදන්කඩවල බටහිර | 128 | 198 | 192 | 390 | 1:0.9 |
| | | තවලන් හල්මිල්ලෑව | 270 | 484 | 472 | 956 | 1:1.03 |
| | | රණවිරු ගම්මානය | 45 | 88 | 70 | 158 | 1:1.03 |
| 618 | ඔළුකරද | ඔලුකරද | 141 | 214 | 203 | 417 | 1:1.0 |
| | | කරඹවත්ත | 137 | 207 | 198 | 405 | 1:1.25 |
| 619 | මුඩපෙරුමාගම | මුඩපෙරුමාගම | 258 | 355 | 343 | 698 | 0.67 |
| | | කොට්ටල්බද්ද | 51 | 77 | 57 | 134 | 0.65 |
| 620 | දුම්රිය නගරය | දුම්රිය නගරය | 435 | 678 | 637 | 1315 | 1:1.03 |
| 621 | ඉහළගම | ඉහළගම | 221 | 317 | 334 | 651 | 1:1.35 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ගොකරැල්ලාගම | 76 | 109 | 128 | 237 | 1:1.06 |
| 622 | ශාස්ත්‍රවෙල්ලිය | ශාස්ත්‍රවෙල්ලිය | 204 | 323 | 276 | 599 | 1:0.94 |
| 623 | කරුක්කන්කුලම | කරුක්කන්කුලම | 51 | 75 | 74 | 149 | 1:0.85 |
| | | කාංජනන්කුලම | 92 | 133 | 138 | 271 | 1:1.17 |
| | | මයිලන්පෙරුමාව | 119 | 187 | 166 | 353 | 1:50:49 |
| 624 | මයිලගස්වැව | මයිලගස්වැව | 89 | 156 | 135 | 291 | 1:49:50 |
| | | තෙලඹියාගම | 39 | 58 | 60 | 118 | 1:52:47 |
| | | පානික්කන්කුලම | 157 | 249 | 235 | 484 | 1:1.15 |
| 625 | නිකිණියාව | නිකිනියාව | 145 | 231 | 213 | 444 | 1:0.96 |
| | | සමගිගම | 112 | 186 | 171 | 357 | 1:1.05 |
| | | තලාව පාර | 61 | 95 | 92 | 187 | 1:08 |
| | | ජන උදාන ගම්මානය | 104 | 159 | 162 | 321 | 1:08 |
| 626 | මලව | මලව | 250 | 413 | 399 | 812 | 1:03 |
| | | තලාව පාර | 63 | 98 | 96 | 194 | 0.98 |
| | | රෝහල පාර | 32 | 47 | 49 | 96 | 53.70 |
| | | ජයන්ති පාර | 114 | 203 | 207 | 410 | 12.83 |
| 627 | මරදන්කඩවල පාර | මරදන්කඩවල පාර | 235 | 338 | 341 | 679 | 6.34 |
| | | නගරසභා නිවාස | 105 | 178 | 181 | 359 | 27.11 |
| | | උසාවි පාර | 139 | 216 | 201 | 417 | 100.88 |
| | | ඩිපෝපාර | 15 | 21 | 25 | 46 | 101.68 |
| 628 | කැකිරාව නගරය | සෙක්කුපිටිය | 201 | 362 | 370 | 732 | 93.5 |
| | | කැ.නගරය | 100 | 130 | 165 | 295 | 119.4 |
| 629 | කුඩාකැකිරාව | කුඩාකැකිරාව | 562 | 1225 | 944 | 2169 | 1:0.97 |
| 630 | මාන්කඩවල | මාන්කඩවල | 212 | 304 | 293 | 597 | 1:0.78 |
| | | විතාරණගම | 60 | 98 | 86 | 184 | 1:1.29 |
| 631 | මල්දෙණිපුර | මල්දෙණිපුර | 418 | 793 | 715 | 1508 | 1:0:97 |
| 632 | ඇඹුල්ගස්වැව | ඇඹුල්ගස්වැව | 151 | 226 | 227 | 453 | 1:1:19 |
| | | නෙල්ලියගම | 95 | 149 | 151 | 300 | 1:1 |
| 633 | මැදවැව | මැදවැව | 69 | 97 | 89 | 186 | 1:0.99 |
| | | අලියාවැටුණුවැව | 82 | 117 | 118 | 235 | 1:0.9 |
| | | කිරිමැටියාව | 123 | 160 | 184 | 344 | 1:1.0 |
| 634 | පොතානේගම | පොතානේගම | 159 | 255 | 241 | 496 | 1:3.06 |
| | | ඉලුකේගම | 230 | 352 | 337 | 689 | 1:1.0 |
| | | වෙරුංකුලම | 201 | 325 | 320 | 645 | 1:1.0 |
| | | ඉලුක්බඩගම | 108 | 163 | 157 | 320 | 1:1.0 |
| 635 | කුඹුක්වැව | කුඹුක්වැව | 275 | 438 | 404 | 842 | 1:1.0 |
| | | මහවැව | 126 | 185 | 200 | 385 | 1:1.0 |
| 636 | රත්මල්කන්ද | රත්මල්කන්ද | 232 | 359 | 325 | 684 | 1:1.0 |
| | | කුඩාවැව | 34 | 65 | 62 | 127 | 1:1.10 |
| | | නබඩවැව | 4 | 5 | 7 | 12 | 1:1.04 |
| 637 | මහ කැකිරාව | තිබ්බටුවැව | 617 | 932 | 895 | 1827 | 1:0.71 |
| | | මහකැකිරාව | 270 | 431 | 428 | 859 | 1:1.04 |
| | | අත්තම් නිවාස | 67 | 89 | 97 | 186 | 1:1.007 |
| | | ඔලොම්බෑව පාර | 70 | 102 | 118 | 220 | 1:1.086 |
| 638 | ඔලොම්බෑව | ඔලොම්බෑව පාර | 448 | 915 | 892 | 1807 | 1:0.91 |
| | | සෙම්බුකුලිය | 138 | 280 | 295 | 575 | 1:1.02 |
| | | ඔලොම්බෑව | 132 | 265 | 283 | 548 | 1:0.94 |
| 639 | කොරසගල්ල | කොරසගල්ල | 266 | 375 | 396 | 771 | 1:0.93 |
| 640 | මැදගම | මැදගම | 212 | 342 | 341 | 683 | 1:0.94 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | උඩකොරසගල්ල | 50 | 74 | 74 | 148 | 1:1002 |
| 641 | මහ ඇලගමුව | මහඇලගමුව | 609 | 958 | 901 | 1859 | 1:0.997 |
| 642 | පල්ලෙහිගුර | පල්ලෙහිගුර | 73 | 110 | 109 | 219 | 1:1.063 |
| | | කුඩා ඇලගමුව | 217 | 298 | 281 | 579 | 1:1.009 |
| 643 | උණගොල්ලෑව | උණගොල්ලෑව | 155 | 251 | 235 | 486 | 1:1.060 |
| | | පහලගම | 162 | 260 | 274 | 534 | 0.95 |
| 644 | හෝරාපොල | හෝරාපොල | 295 | 472 | 546 | 1018 | 1.05 |
| | | මොරගොල්ලාගම | 218 | 293 | 347 | 640 | 1:157 |
| 645 | නිදිගම | සූරියගම | 304 | 491 | 517 | 1008 | 1:184 |
| | | නිදිගම | 367 | 596 | 543 | 1139 | 1:1.05 |
| 646 | බරාවිල | බරාවිල | 47 | 64 | 75 | 139 | 1:0.91 |
| | | හුදලියාගම | 146 | 229 | 225 | 454 | 01:17 |
| 647 | මුරුංගාහිටිකන්ද | කයිලපතාන | 200 | 334 | 334 | 668 | 00:23 |
| | | මූරුංගාහිටිකන්ද | 245 | 412 | 365 | 777 | 1:1 |
| 648 | කොටාගල | කොටාගල | 352 | 608 | 548 | 1156 | 1:1.1 |
| 649 | නෙල්බෑගම | නෙල්බෑගම | 162 | 254 | 233 | 487 | 01:09 |
| | | ඉහලගම | 47 | 83 | 86 | 169 | 1:1.09 |
| 650 | මඩාටුගම | මඩාටුගම | 188 | 363 | 305 | 668 | 1:0 |
| | | කඩවීදිය | 225 | 432 | 393 | 825 | 01:14 |
| | | බක්මීගහ උල්පත | 215 | 376 | 328 | 704 | 1:0.9 |
| 651 | කණ්ඩලම නැගෙනහිර | කණ්ඩලම නැගෙනහිර | 664 | 1132 | 1123 | 2255 | 1:1 |
| 652 | කිතුල්හිටියාව | කිතුල්හිටියාව | 143 | 316 | 292 | 608 | 1:1 |
| | | මොරගස්වැව | 179 | 334 | 329 | 663 | 1:1 |
| | | පහල බූලාගල | 114 | 219 | 201 | 420 | 1:0.9 |
| 653 | කණ්ඩලම බටහිර | කණ්ඩලම බටහිර | 403 | 749 | 757 | 1506 | 1:1.036 |
| 654 | දූණුමඩලාව | දූණුමඩලාව | 239 | 393 | 379 | 772 | 1:1.086 |
| | | හැවැන්තැන්නේගම | 171 | 277 | 255 | 532 | 1:1.06 |
| 655 | බණ්ඩාරපොතාන | බණ්ඩාරපොතාන | 388 | 701 | 672 | 1373 | 1:1.15 |
| | | කඩාඩුගම | 132 | 232 | 234 | 466 | 1:1.01 |
| 656 | උදුරව | උදුරව උතුර | 205 | 353 | 332 | 685 | 1:1.031 |
| | | උදුරව දකුණ | 79 | 141 | 122 | 263 | 1:1.10 |
| | | කොම්පලයාගම | 57 | 89 | 97 | 186 | 1:1.11 |
| | | දෙන්නෑව | 36 | 66 | 64 | 130 | 1:0.99 |
| 657 | දඹෙවටන | දඹෙවටන | 158 | 276 | 278 | 554 | 1:1.05 |
| | | කලාගම | 260 | 408 | 386 | 794 | 1:1. |
| | | අලුත් බලලු වැව | 30 | 57 | 57 | 114 | 1:1. |
| **එකතුව** | | | **21883** | **36415** | **35243** | **71658** | |

## පලුගස්වැව කොට්ඨාශය

| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | ගම්මානය | පවුල් ගණන | ජනගහනය | පුම්තිරි අනුපාතය | | |
|---|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | |
| 589 - හබරණ | නගර නිර්මාණ පෙදෙස | 45 | 106 | 112 | 218 | 0.946 |
| | අනුරාධපුර පාර | 60 | 119 | 109 | 228 | 1.092 |
| | අරුණෝදාගම | 44 | 112 | 98 | 210 | 1.143 |
| | පොළොන්නරු පාර | 72 | 126 | 131 | 257 | 0.962 |
| | ලක්සිරිගම | 131 | 197 | 183 | 380 | 1.077 |
| | හබරණගම | 198 | 322 | 307 | 629 | 1.049 |
| | දඹුල්ල පාර | 290 | 492 | 481 | 973 | 1.023 |
| | ත්‍රිකුණාමලය පාර | 235 | 334 | 344 | 678 | 1.00 |
| 590 - කාශ්‍යපගම | කාශ්‍යපගම | 390 | 563 | 578 | 1141 | 0.974 |
| | පිංසිරිගම | 89 | 140 | 122 | 262 | 1.148 |
| 591 හිරිවඩුන්න | හිරිවඩුන්න | 311 | 443 | 450 | 893 | 0.984 |
| | කුඩාමීගස්වැව | 110 | 157 | 162 | 319 | 0.97 |
| 592 වායා උල්පත | බුලනගම | 108 | 173 | 187 | 360 | 0.925 |
| | තිඹලව | 123 | 168 | 176 | 344 | 0.955 |
| | පහලගම | 67 | 100 | 99 | 199 | 1.01 |
| | සියඹලාගස්වැව | 55 | 76 | 73 | 149 | 1.041 |
| | උල්පතගම | 37 | 59 | 56 | 115 | 1.054 |
| 593 කැලෑව | බෙල්ලන්කඩවල | 416 | 636 | 615 | 1251 | 1.034 |
| 594 දෙමුන්නෑව | දෙමුන්නෑව | 73 | 106 | 102 | 208 | 1.039 |
| | ගල්කඩවල | 93 | 146 | 150 | 296 | 0.973 |
| 595 කුඩාරඹාවැව | කුඩාරඹාවැව | 125 | 191 | 170 | 361 | 1.124 |
| | පුවක්පිටිය | 179 | 267 | 250 | 517 | 1.068 |
| 596 කුඹුක්වැව | කුඹුක්වැව | 94 | 131 | 130 | 261 | 0.723 |
| | වේරගල | 210 | 287 | 292 | 579 | 0.983 |
| 597 එප්පාවල | ආසිරිගම | 236 | 336 | 329 | 665 | 1.021 |
| | එප්පාවල | 64 | 99 | 96 | 195 | 1.031 |
| | 5 කණුව | 41 | 56 | 54 | 110 | 1.037 |
| | හබදිවුල්වැව | 52 | 76 | 76 | 152 | 1 |
| 598 මඩවල | නාමල්පුර | 254 | 374 | 332 | 706 | 1.127 |
| | මහමීගස්වැව | 130 | 198 | 194 | 392 | 1.021 |
| | සියඹලාදමන | 21 | 30 | 26 | 56 | 1.154 |
| 599 මහාරඹාවැව | හල්මිල්ලවැව පැරණිගම | 101 | 159 | 140 | 299 | 1.136 |
| | හල්මිල්ලවැව රඹෑව පාර | 91 | 136 | 134 | 270 | 1.015 |
| | මහාරඹාවැව | 78 | 111 | 116 | 227 | 0.957 |
| 600 මෛත්‍රීගම | මෛත්‍රීගම | 129 | 213 | 188 | 401 | 1.133 |
| | තෙල්හවඩියාව | 30 | 40 | 37 | 77 | 1.081 |
| | නිකගහවැව | 9 | 15 | 16 | 31 | 0.938 |
| 601 පලුගස්වැව | පලුගස්වැව | 408 | 612 | 585 | 1197 | 1.046 |
| 602 සේනාදිරියාගම | සේනාදිරියාගම | 328 | 468 | 471 | 939 | 0.994 |
| | උල්පතගම | 48 | 69 | 72 | 141 | 0.958 |
| 603 හොරිවිල | හොරිවිල | 363 | 561 | 519 | 1080 | 1.081 |
| | උඩකඩවල | 91 | 114 | 124 | 238 | 0.92 |
| 604 ගලපිටගල | ගලපිටගල | 198 | 274 | 264 | 538 | 1.038 |
| **මුළු එකතුව** | | **6227** | **9392** | **9150** | **18542** | |

### කැකිරාව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ජනගහනය - සාරාංශය


| අ.අ. | කොට්ඨාශය | පවුල් ගණන | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|---|---|
| 01. | කැකිරාව | 21,883 | 36,415 | 35,243 | 71,658 |
| 02. | පලුගස්වැව | 6,227 | 9,392 | 9,150 | 18,542 |
| | | **28,110** | **45,807** | **44,393** | **90,200** |

- මෙම ජනගහණ තොරතුරු කැකිරාව හා පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සම්පත් පැතිකඩ - 2023 අනුව ලබාගත් තොරතුරු අනුසාරයෙන් සකස් කර ඇති බව කරුණාවෙන් සළකන්න.

### පොදු සංඛ්‍යා ලේඛණ තොරතුරු

| අනු අංකය | විස්තරය | ඒකකය |
|---|---|---|
| 01 | **පොදු තොරතුරු** | |
| | පළාත | උතුරු මැද පළාත |
| | පරිපාලන දිස්ත්‍රික්කය | අනුරාධපුර |
| | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ | කැකිරාව, පලුගස්වැව |
| | බල ප්‍රාදේශයේ විශාලත්වය | වර්ග කිලෝමීටර් 529 කි |
| | ග්‍රාම නිළධාරී තුළාන් ගණන | 69 |
| | ගම් ගණන | 164 |
| | ප්‍රාදේශිය සභාවට අයත් උපකාර්යාල ගණන (මරදන්කඩවල,පලුගස්වැව, මරදන්කඩවල) | 03 |
| | ජනගහනය (පලුගස්වැව හා කැකිරාව) | 90200 |
| | ප්‍රාදේශිය සභා කාර්යාලයේ රාජකාරී කිරීමට අනුමත කාර්ය මණ්ඩලය | 102 |

## Grama Niladai Division & Road Network - Kekirawa Pradeshiya Sabha





| | |
|---|---|
| Buddhist Temple | BT |
| Church | Ch |
| Circuit Bungalow | CB |
| Court | C |
| Hindu Temple | HT |
| Historical Sites | HS |
| Mosque | M |
| Police Station | PS |
| Post Office | PO |
| Railway Station | RS |
| Rest House | RH |
| School | S |
| Sub Post Office | SPO |


| | |
|---|---|
| 623 | Karukkankulama |
| 624 | Mallagaswewa |
| 625 | Neekiniyawa |
| 626 | Malawa |
| 627 | Maradakadawala Road |
| 628 | Kekirawa Town |
| 629 | Kuda Kekirawa |
| 630 | Mankadawala |
| 631 | Maidanipura |
| 632 | Ebulgaswewa |
| 633 | Medawewa |
| 634 | Pothanegama |
| 635 | Kubukwewa |
| 636 | Raththalawa |
| 637 | Maha Kekirawa |
| 638 | Olombewa |
| 639 | Korasagalla |
| 640 | Medagama |
| 641 | Maha Elagamuwa |
| 642 | Palahiyura |
| 643 | Unagollewa |
| 644 | Horapola |
| 645 | Nidigama |
| 646 | Baravila |
| 647 | Murugehetiyakanda |
| 648 | Kotagala |
| 649 | Nelbegama |
| 650 | Madatugama |
| 651 | Kandalama East |
| 652 | Kiluthiriyawa |
| 653 | Kandalama West |
| 654 | Dunumadalawa |
| 655 | Bandarapothana |
| 656 | Unduruwa |
| 657 | Dambewatana |

| | |
|---|---|
| 589 | Habarana |
| 590 | Kashyapagama |
| 591 | Hiriwadunna |
| 592 | Wayasipatha |
| 593 | Kelewa |
| 594 | Demusthewa |
| 595 | Kuda Rambawewa |
| 596 | Kumbukwewa |
| 597 | Eppawala |
| 598 | Madawala |
| 599 | Maha Rambawewa |
| 600 | Maithreegama |
| 601 | Palugaswewa |
| 602 | Senadhiriyagama |
| 603 | Horivila |
| 604 | Galapitagala |
| 605 | Nawakkulama |
| 606 | Moragoda |
| 607 | Keeriyagaswewa |
| 608 | Mahadivulwewa |
| 609 | Heenukkiriyawa |
| 610 | Ganewalpola |
| 611 | Maminiya Rambewa |
| 612 | Kollankuttama |
| 613 | Maminiyawa |
| 614 | Thorawewa |
| 615 | Halapuliyankulama |
| 616 | Ihala Puliyankulama |
| 617 | Maradankadawala |
| 618 | Olukaranda |
| 619 | Mudaperumagama |
| 620 | Railway Town |
| 621 | Ihalagama |
| 622 | Shasthrawelliya |


## 2024.12.31 දිනට අනුමත හා සත්‍ය කාර්ය මණ්ඩලය
## ස්ත්‍රී/ පුරුෂ භාවය සහ වයස් විශ්ලේෂණය අනුව
## කැකිරාව ප්‍රාදේශීය සභාව

| අ/අ | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | ස්ත්‍රී/පුරුෂ | | වයස් විශ්ලේෂණය අනුව | | | අනියම් | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ස්ත්‍රී | පුරුෂ | අවු 35 ට අඩු | අවු 35 ත් 45ත් අතර | අවු 45 ට වැඩි | | |
| 01 | ලේකම් | 1 | 1 | 1 | | | | 1 | | |
| 02 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | 1 | 1 | 1 | | | 1 | | | |
| 03 | කළමනාකරණ සහකාර | 10 | 9 | 8 | 1 | 1 | 5 | 3 | | 1 |
| 04 | සංවර්ධන නිලධාරී | 5 | 6 | 5 | 1 | 3 | 3 | | | |
| 05 | සහකාර ගිණුම් නිලධාරී | 1 | 1 | 1 | | | 1 | | | |
| 06 | පුස්තකාලයාධිපති | 3 | 1 | 1 | | | 1 | | | 2 |
| 07 | තාක්ෂණ නිලධාරී | 3 | 2 | | 2 | 1 | 1 | | | 1 |
| 08 | ආදායම් පරීක්ෂක | 5 | 3 | 1 | 2 | 1 | | 2 | | 2 |
| 09 | ක්ෂේත්‍ර වැඩ අධීක්ෂක | 1 | 1 | | 1 | | 1 | | | |
| 10 | සෞඛ්‍ය පරිපාලක | 1 | 1 | | 1 | | 1 | | | |
| 11 | පොදු වෙළඳපල භාරකරු | 1 | 0 | 0 | | | | | | |
| 12 | කාර්යාල කාර්යය සහායක | 6 | 6 | 2 | 4 | 2 | | 4 | | |
| 13 | පුස්තකාල සහායක | 5 | 4 | 4 | | | 3 | 1 | | 1 |
| 14 | මුරකරු | 5 | 4 | | 4 | | | 4 | | 1 |
| 15 | රියදුරු | 4 | 4 | | 4 | | 1 | 3 | | |
| 16 | නළ ලිං ක්‍රියාකරු | 1 | 0 | 0 | | | | | | 1 |
| 17 | විදුලි කාර්මික | 1 | 1 | | 1 | | | 1 | | |
| 18 | ආදාහනාගාර යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | | 1 | | | 1 | | |
| 19 | ආදාහනාගාර සහායක | 1 | 1 | | 1 | | | 1 | | |
| 20 | ඖෂධ සංයෝජක | 1 | 0 | 0 | | | | | | 1 |
| 21 | ආයුර්වේද කම්කරු | | 1 | 1 | | | | 1 | | |
| 22 | බර යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | | 1 | | 1 | | | |
| 23 | මාර්ග කම්කරු | 20 | 20 | 2 | 18 | 1 | 9 | 10 | | |
| 24 | සෞඛ්‍ය කම්කරු | 24 | 23 | 2 | 21 | 2 | 7 | 14 | 2 | 0 |
| | එකතුව | **102** | **92** | **29** | **63** | **11** | **35** | **46** | **2** | **10** |








## කැකිරාව ප්‍රාදේශීය සභාවේ සංවිධාන ව්‍යුහය





## 2025 ආදායම් ඇස්තමේන්තු විශ්ලේෂණය


### කැකිරාව ප්‍රාදේශිය සභාව



## අයවැය ප්‍රතිපත්ති

01. අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/දෛනික පදනම මත බඳවා ගන්නා අය සඳහා වෙන් කරන වැටුප් හා දීමනා ප්‍රමාණය ස්වයං උත්පාදිත ආදායමින් 30%ක් නොඉක්මවීම.
02. ප්‍රාග්ධන වියදම් සඳහා ස්වයං උත්පාදිත ආදායමින් 15%ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් වෙන් කිරිම.
03. ආපදා කළමනාකරණය සඳහා වාර්ෂික ස්වයං උත්පාදිත ආදායමින් 0.5%ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් වෙන් කිරීම.
04. අධ්‍යාපන කටයුතු හා වෘත්තීය අධ්‍යාපනය සඳහා ස්වයං උත්පාදිත ආදායමින් 0.5%ක් වෙන් කිරීම.
05. බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ප්‍රවර්ධන හා රෝග නිවාරණය සඳහා වාර්ෂික ස්වයං උත්පාදිත ආදායමින් 3%ක් වෙන් කිරිම
06. සියලුම දේපල සඳහා වරිපනම් ප්‍රතිශතය 12%ක උපරිම මට්ටමේ පවත්වාගෙන යාම.
07. සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වල ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මුළු පිරිවැටුම මත 1%ක උපරිමයක් වන පරිදි බලපත්‍ර ලබා දීම.
08. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය, අභිප්‍රේරණය හා සුභසාධක කටයුතු වෙනුවෙන් ස්වයං උත්පාදිත ආදායමින් 0.05%ක් වෙන් කිරිම
09. වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේ දී පහත සඳහන් කණ්ඩායම්වල ඇතුළත්භාවය සහිත ප්‍රවේශයන් භාවිතා කරයි.
    - ❖ කාන්තා කණ්ඩායම්වල ඉදිරි දර්ශනය හා ප්‍රමුඛතාවයන් සැළකිල්ලට ගැනීම සහතික කිරීම.
    - ❖ ආර්ථික වරප්‍රසාද නොලත් කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතාවයන් සහ අභියෝග ආමන්ත්‍රණය කිරීම සහතික කිරීම.
    - ❖ සාමාජීය වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම්වල අනන්‍යතාවයන් සහ ඕනෑ එපාකම් සළකා බැලීම.
    - ❖ පෞද්ගලික අංශයේ කණ්ඩායම්වල පරිඥානය සහ නිර්දේශයන් සළකා බැලීම.
    - ❖ අවිධිමත් ව්‍යාපාර අංශයේ කණ්ඩායම්වල වැදගත්කම සැළකිල්ලට ගෙන ඔවුන්ගේ ඉදිරි දර්ශනය අයවැය ඇතුළත් කිරීම සළකා බැලීම.
    - ❖ තරුණ අවිධිමත් කණ්ඩායම්වල වැදගත්කම සැළකිල්ලට ගෙන තරුණ කණ්ඩායම්වල සහභාගීත්වය සහ නියෝජනය සහතික කිරිම.
    - ❖ ආබාධිත අවිධිමත් කණ්ඩායම්වල අයිතිවාසිකම් සහ අවශ්‍යතා පිළිගනිමින් ඔවුන්ගේ ඉදිරි දර්ශනය අයවැය තීරණ ඇතුළත් කිරිම.
10. සැමට පිරිසිදු පානීය ජලය සැපයීම වෙනුවෙන් ස්වයං උත්පාදිත ආදායමින් 1%ක් වෙන් කිරීම.
11. සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සැළසීම වෙනුවෙන් ස්වයං උත්පාදිත ආදායමින් 5%ක් වෙන් කිරිම.
12. පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වෙනුවෙන් සෑම වර්ෂයකම ස්වයං උත්පාදිත ආදායමින් 1%ක් වෙන් කිරීම.
13. වෙනත් ප්‍රතිපත්ති

- ක්‍රීඩා පිටිය වෙන් කිරීම

01. පාසැල් - පාසල් ක්‍රිඩා හා මුදල් අයකිරීමකින් තොරව සිදුකරනු ලබන ක්‍රීඩා වැඩසටහන් සඳහා නොමිලේ ලබාදීම. මෙහිදී රු.5,000.00ක මුදලක් කසළ ඉවත් කිරීම වෙනුවෙන් ආපසු ගෙවීමේ පදනම මත තැන්පත් කළ යුතු වේ. නිසි පරිදි කැළි කසළ ඉවත් කළ බවට තහවුරු කරගත් පසු අදාළ තැන්පතු මුදල නිදහස් කෙරේ.
02. පෙර පාසැල් - පෙර පාසල් උත්සව සඳහා ක්‍රීඩා පිටිය නොමිලේ ලබා දේ. මෙහිදී රු.5000.00ක මුදලක් කසළ ඉවත් කිරීම වෙනුවෙන් ආපසු ගෙවීමේ පදනම මත තැන්පත් කළ යුතු වේ. නිසි පරිදි කැළි කසළ ඉවත් කළ බවට තහවුරු කරගත් පසු අදාළ තැන්පතු මුදල නිදහස් කෙරේ.
03. රජයේ ආයතන - බලප්‍රදේශය තුළ පවතින පූර්ණ රාජ්‍ය ආයතන සඳහා මුදල් අයකිරීමකින් තොරව සිදුකරන වැඩසටහන් සඳහා නොමිලේ ක්‍රීඩාපිටිය වෙන්කර ගත හැකි ය. මෙහි දී රු5000.00ක මුදලක් කසළ ඉවත් කිරීම වෙනුවෙන් ආපසු ගෙවීමේ පදනම මත තැන්පත් කළ යුතු වේ. නිසි පරිදි කැළි කසළ ඉවත් කළ බවට තහවුරු කරගත් පසු අදාළ තැන්පතු මුදල නිදහස් කෙරේ.
04. ක්‍රීඩා සමාජ - බලප්‍රදේශය තුළ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩාපිටිය ලබා දීම

දිනකට ක්‍රීඩාපිටිය වෙන් කිරීම සඳහා අනුමත ගාස්තුවට සමාන මුදලක් මාස 01ක සේවා ගාස්තු ලෙස අයකිරීමේ පදනමින් ගිවිසුම්ගත වීම හා ක්‍රීඩාපිටියේ ආරක්ෂාව වෙනුවෙන් මාස 01ක් සඳහා අයකිරීමට නියමිත මුදල මෙන් තුන්ගුණයක ආරක්ෂිත ඇප තැන්පතුවක් ලබාගෙන වාර්ෂිකව අලුත්වන පරිදි ගිවිසුම්ගත වී සභාව මගින් විශේෂ වෙන් කිරීම් සිදු නොවන දිනවලදී ක්‍රීඩා පුහුණුවීම් සඳහා ලබාදීම. මෙහිදී ක්‍රමානුකූලව කසළ බැහැර කිරීමේ කොන්දේසිය මත ලබාදීම අනිවාර්යය වේ.

- කැකිරාව පොදු වෙළඳපල කඩ කාමර ලබාදීම.

  01. බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාන්තා ව්‍යවසායිකාවන් සඳහා අවමය 20%ක ඉඩකඩක් ලබාදීම.
  02. බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචි විශේෂ අවශ්‍යතා සහිත (සාමාජීය වහයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම්/පුද්ගලයින්) ව්‍යවසායකයන් සඳහා 5%ක ඉඩකඩක් වෙන් කිරීම.
- කැකිරාව ඉරුදින සතිපොළ ඉඩකඩ වෙන් කිරීම.
  01. බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාන්තා හා වැන්දඹු කාන්තා ව්‍යවසායකයින් සඳහා අවමය 20%ක ඉඩකඩක් ලබා දීම.
  02. ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි විශේෂ අවශ්‍යතා සහිත (සාමාජීය වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම්/පුද්ගලයින්) ව්‍යවසායකයන් සඳහා 50%ක ඉඩකඩක් වෙන් කිරීම.
- යන්ත්‍ර කුලියට දීම
  - ➢ බැකෝ ලෝඩරයි (JCB) කුලියට දීම.
    * බලප්‍රදේශය තුළ පවතින පන්සල්/කෝවිල්/පල්ලි/ආරණ්‍ය සේනාසන සඳහා ඉන්ධන රහිතව උපරිමය පැය 02 කාලයක් නොමිලේ ලබා දීමටත් ඊට වැඩිවන කාලය සඳහා අනුමත ගාස්තු අය කිරීම.
    *උපරිමය පැය 02කට සීමාවන පරිදි කැකිරාව උසාවිය හා කැකිරාව පොලිසියට බැකෝ ලෝඩරය අත්‍යාවශ්‍ය කටයුතු වලදී ලබා දීමටත්, ඊට වැඩිවන අවස්ථා වල දී අනුමත ගාස්තු අය කිරීම.
    *ඉහත සඳහන් ආයතන හැර වෙනත් කිසිඳු ආයතනයක් සඳහා කිසිම ආකාරයකින් නොමිලේ ලබා නොදීම.

  - ➢ තණකොළ කපන යන්ත්‍ර කුලියට දීම.
    *බලප්‍රදේශය තුළ පවතින පාසල් - දුෂ්කර/ පාසල් සඳහා ඉන්ධන රහිතව ක්‍රීඩා පිටිවල තණකොල කැපීම.
    *බලප්‍රදේශය තුළ පවතින රජයේ ආයතන - උසාවිය හා පොලීසිය සඳහා නොමිලේ ලබා දීම හා අනෙකුත් කිසිඳු ආයතනයකට නොමිලේ ලබා නොදීම.

  - ➢ ජල බවුසර් කුලියට දීම.
    *බලප්‍රදේශය තුළ පැවැත්වෙන අවමංගල්‍ය උත්සව සඳහා ජලය රහිතව ජල බවුසර් සේවා සැපයීම.

- කොඩිකණු කුලියට දීම

  01. බලප්‍රදේශය තුළ පවතින රජයේ ආයතන - අනුමත ගාස්තුවෙන් 50%ක් ගෙවිය යුතු වේ. (කොඩි කණුවකට රු.200.00 බැගින් වූ ආපසු ගෙවන ඇප තැම්පතුවකට යටත්ව)
  02. බලප්‍රදේශය තුළ පවතින පාසැල් - නොමිලේ ලබාදීම (කොඩි කණුවකට රු. 200.00 බැගින් වූ ආපසු ගෙවන ඇප තැම්පතුවකට යටත්ව)
  03. බලප්‍රදේශය තුළ පවතින පන්සල්/කෝවිල්/පල්ලි/ආරණ්‍ය සේනාසන - නොමිලේ ලබාදීම (කොඩි කණුවකට රු. 200.00 බැගින් වූ ආපසු ගෙවන ඇප තැම්පතුවකට යටත්ව)

- ආදාහනාගාරය වෙන් කිරීම

  01. බලප්‍රදේශය තුළ පවතින පාසල් හා පෙර පාසල් - අනුමත ගාස්තුවෙන් 50%ක මුදලක් අය කෙරේ.

02. බලප්‍රදේශය තුළ පවතින රජයේ ආයතන - පූර්ණ රාජ්‍ය ආයතනවල වැඩසටහන් වෙනුවෙන් අනුමත ගාස්තුවෙන් 75%ක මුදලක් අය කෙරේ.
03. සාම්ප්‍රදායික දේශීය කලා කටයුතු දිරිමත් කිරීමේ අරමුණින් අනුමත ගාස්තුවෙන් 20%ක වට්ටමක් සහිතව නගර ශාලාව වෙන් කිරිමට අවස්ථාව ලබාදීම (වේදාක නාට්‍ය, රූකඩ නාට්‍ය, කවි මඩු හා ගී රසවින්දන වැඩසටහන් වැනි)

- නගර ශාලාව වෙන් කිරිම
    01. බල ප්‍ර දේශය තුළ පවතින පාසල් හා පෙර පාසල් - අනුමත ගාස්තුවෙන් 50% ක මුදලක් අය කෙරේ
    02. බල ප්‍ර දේශය තුළ පවතින රජයේ ආයතන - පූර්ණ රාජ්‍ය ආයතනවල වැඩසටහන් වෙනුවෙන් අනුමත ගාස්තුවෙන් 75%ක මුදලක් අය කෙරේ.
    03. සම්ප්‍රදායික දේශිය කලා කටයුතු දිරිමත් කිරීමේ අරමුණින් අනුමත ගාස්තුවෙන් 20%ක වට්ටමක් සහිතව නගර ශාලාව වෙන්කිරිමට අවස්ථාව ලබා දිම. ( වේදිකා නාට්‍ය, රූකඩ නාට්‍ය, කවි මඩු හා ගී රස වින්දන වැඩසටහන් වැනි)

## (747) කැකිරාව ප්‍රාදේශීය සභාව

### අයවැය සාරාංශය - 2025

| අය ශීර්ෂය | අය විස්තරය | 2023 සත්‍ය ආදායම | 2024.09.30 දක්වා සත්‍ය ආදායම | 2024 ආදායම් ඇස්තමේන්තු | 2025 ආදායම් ඇස්තමේන්තු | වැය ශීර්ෂය | වැය විස්තරය | 2023 සත්‍ය වියදම | 2024.09.30 දක්වා සත්‍ය වියදම | 2024 වියදම් ඇස්තමේන්තු | 2025 වියදම් ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන ආදායම් | | | | | | පුනරාවර්තන වියදම් | | | | | |
| 4100 | වරිපනම් හා බදු | 9,647,104 | 17,525,483 | 20,332,842 | 24,600,733 | 1000 | වැටුප් හා වේතන | 22,477,825 | 46,438,848 | 91,114,520 | 93,548,830 |
| 4200 | කුලී | 12,998,269 | 12,686,309 | 19,853,933 | 22,020,398 | 1100 | ගමන් ගාස්තු | 686,598 | 422,562 | 641,000 | 1,189,200 |
| 4300 | බලපත්‍ර ගාස්තු | 3,585,048 | 3,336,742 | 8,001,000 | 6,261,000 | 1200 | සැපයුම් | 4,437,647 | 13,603,576 | 23,028,000 | 20,334,000 |
| 4400 | සේවා ගාස්තු | 4,275,050 | 3,387,561 | 7,666,000 | 7,228,000 | 1300 | අළුත්වැඩියා හා නඩත්තු | 3,842,060 | 4,027,746 | 22,327,000 | 25,950,000 |
| 4500 | වරෙන්තු හා අධිභාර | 127,897 | 25,724 | 870,000 | 395,000 | 1400 | පරිපාලන වියදම් | 2,027,078 | 2,161,952 | 5,499,000 | 3,498,800 |
| 4600 | වෙනත් විකුණුම් | 321,261 | 239,461 | 900,000 | 600,000 | 1500 | සුභ සාධක ගෙවීම් | 117,450 | 313,300 | 2,982,000 | 2,650,000 |
| 4700 | පොලී ආදායම් | 7,168,492 | 955,336 | 3,800,000 | 2,300,000 | 1600 | විවිධ ගෙවීම් | 3,532,408 | 389,898 | 3,935,000 | 2,924,000 |
| 4800 | විවිධ ආදායම් | 43,640,922 | 31,921 | 34,232,000 | 28,727,000 | 1700 | වෙනත් | 1,630,569 | 2,421 | 508,000 | 2,000 |
| 4850 | ස්ථාවර වත්කම් විකිණීම මත ලාභ | - | - | 25,000 | 25,000 | 1850 | ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත පාඩු | 25,970 | - | 25,000 | 26,000 |
| 4900 | ව්‍යාපෘති ආදායම් | 294,587 | 566,715 | - | 1,500,000 | 1900 | මූල්‍ය පිරිවැය | 2,209,535 | 2,019,774 | 2,848,600 | 2,578,625 |
| 5100 | පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් | 50,671,214 | 37,129,137 | 75,452,523 | 86,852,620 | | | | | | |
| **පුනරාවර්ථන ආදායම් එකතුව** | | **132,729,842** | **75,884,388** | **171,133,298** | **180,509,752** | **පුනරාවර්තන වියදම් එකතුව** | | **40,987,139** | **69,380,077** | **152,908,120** | **152,701,455** |
| 5200 | විස්තීර්ණ ආදායමේ හඳුනා ගන්නා ප්‍රාග්ධන වියදම් ප්‍රදාන | 5,509,044 | - | 4,940,731 | 4,876,769 | 1800 | වර්ෂයේ ක්ෂය සඳහා වෙන් කිරීම | 3,423,701 | - | 16,026,165 | 13,549,316 |
| | | | | | | වසර සඳහා අතිරික්තය (ඌණතාවය) | | 93,828,046 | 6,504,311 | 7,139,745 | 19,135,750 |
| **මුළු එකතුව** | | **138,238,886** | **75,884,388** | **176,074,030** | **185,386,521** | **මුළු එකතුව** | | **138,238,886** | **75,884,388** | **176,074,030** | **185,386,521** |

-ස්වයං උත්පාදිත ආදායම් ඇස්තමේන්තුව රු.මි.93 (රු.93,657,132)
-උසාවි දඩ හා මුද්දර ගාස්තු හැර ස්වයං උත්පාදිත ආදායම ඇස්. රු. මි.66 (රු.66,107,132)

-ජංගම නොවන වත්කම් ඇස්තමේන්තුව රු.33 (රු.45,035,750)
-පුනරාවර්තන නොවන වියදම් සඳහා ප්‍රදාන රු. මි.25 (රු.25,900,000)
-ස්වයං උත්පාදන ආදායම් මත පුනරාවර්තන නොවන වියදම් ඇස්තමේන්තුව රු.මි.19 (රු.19,135,750)

-පුනරාවර්තන වියදම (සංවර්ධන යෝජනා) - මාර්ග අලුත්වැඩියා හා නඩත්තු රු.මි.16 (රු.16,600,000)

-පුනරාවර්තන අතිරික්තය - රු.මි.27 (රු.27,808,297)
-සමස්ත අයවැය අතිරික්තය -රු. මි.19 (රු.19,135,750)